# වාර්ෂික වාර්තාව
# ஆண்டறிக்கை
# Annual Report




NIOSH
National Institute of Occupational Safety and Health • Sri Lanka

# 2023

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනය

தேசிய தொழில்சார் பாதுகாப்பு மற்றும் சுகாதார நிறுவகம்

National Institute of Occupational Safety & Health

# වාර්ෂික වාර්තාව
# 2023

## ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනය

# වාර්ෂික වාර්තාව - 2023

**සම්පාදනය**
චම්පිකා අමරසිංහ , මොහාන් පෙරේරා

**ප්‍රකාශනය**
ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනයේ
ප්‍රකාශන කමිටුව

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනය
නො. 97/ජාවත්ත පාර,කොළඹ 05. ශ්‍රී ලංකාව
ටෙලි : +94 112 2 585 425

**සියලු හිමිකම් ඇවරිණ**

ISBN -



2009 අංක 38 දරන ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පිළිබඳ ආයතන පනත මඟින් කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ අනුබද්ධ ආයතනයක් ලෙස ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනය පිහිටුවන ලදී ස්වයං මුල්‍යය ආයතනයක් ලෙස ක්‍රියාත්මක වන අප ආයතනයේ මුඛ්‍යය පරමාර්ථය වනුයේ ජාත්‍යන්තර මට්ටමේහි වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය සේවාවන් ලබාදීමයි.

ආරම්භයේ පටන්ම සම්මන්ත්‍රතරණ පැවැත්වීම හා වෘත්තීය සුරක්ෂිතතා නිළධාරීන් පුහුණු කිරීම හා සාමාන්‍යය ජනතාව වෘත්තීය සුරක්ෂිතතාව පිළිබඳ දැනුවත් කිරීම ආදි කටයුතු වල නිරතවී සිටින්නෙමු. වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පිළිබඳ වෘත්තීක-යන්ට නව දැනුම ලබාදීමට හා ඔවුන්ගේ දැනුම ඔවුන් අතර හුවමාරු කර ගැනීමට අවශ්‍යය පසුබිම අප විසින් නිර්මාණය කරදෙන්නෙමු. වැඩ පරිසරයක් පවත්වාගෙන යාම පිළිබඳ ජනතාව දැනුවත් කිරීම ආරක්ෂාකාරි වැඩ පරිසරයක් නිර්මාණය කිරීම හා නිවැරදි ලෙස පවත්වාගෙන යාමට අවශ්‍යය දැනුම නිරන්තරයෙන් ලබාදීමට අප කටයුතු කරන්නෙමු.

අප සෑම විටම අපගේ පාරිභෝගිකයන්ට ගරු කරමින් අපක්ෂපාතීව තාක්ෂණික සේවාවන් ලබාදීමට කටයුතු කරන්නේමු. වෘත්තීය අනතුරු වළක්වා ගැනීමට අවශ්‍යය දැනුම ඔවුන් වෙත ලබාදීමට මෙන්ම අවශ්‍යය අවස්ථාවලදි ඔවුන්ට අවශ්‍යය පුහුණුව ලබාදීමට ද අප නිරන්තයෙන් කැපවී සිටින්නෙමු .අප ලබා දෙන පුහුණුව තුළින් සේවා ස්ථානයේ ඇති අනතුරු හදුනාගෙන ඒ සදහා අවශ්‍යය විසදුම් ලබා ගැනීමටත් ඔවුන්ට හැකියාව ඇත.

වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පිළිබඳ ජාතික හා ජාත්‍යන්තර වශයෙන් කටයුතු කරන එකම රාජ්‍යය ආයතනය අප ආයතනය වන බැවින් ශ්‍රී ලාංකික ජනතාවට අවශ්‍යය සේවාව සැපයීම උදෙසා අප නිරන්තරයෙන් කටයුතු කරන්නෙමු.

වෛද්‍යය එන් සි අමරසිංහ
අධ්‍යක්ෂ ජනරාල්

## ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය

| නම | තනතුර | කමිටුව තුළ දරණ තනතුර |
|---|---|---|
| ආර්.පී.ඒ.විමලවීර මයා | ලේකම්,<br>කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය | සභාපති |
| වෛද්‍ය එන්.සී.අමරසිංහ මිය | අධ්‍යක්ෂ ජනරාල්<br>ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය | කමිටු සාමාජික |
| ප්‍රභාත් චන්ද්‍රකීර්ති මයා | කම්කරු කොමසාරිස් ජනරාල් | කමිටු සාමාජික |
| කේ.ඒ.බී.කුරුප්පු මයා | ප්‍රධාන ගණකාධිකාරි | කමිටු සාමාජික |
| වෛද්‍ය ඉනෝකා සුරවීර මිය | විශේෂඥ ප්‍රජා වෛද්‍ය උපදේශක,<br>සෞඛ්‍ය අමාත්‍යංශය | කමිටු සාමාජික |
| එල්.ටී.එස්.කරුණාරත්න මයා | නියෝජ්‍ය අධ්‍යක්ෂ<br>ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව | කමිටු සාමාජික |
| ඊ.අබේසිරිවර්ධන මයා | කොමසාරිස් වෘත්තීය සුරක්ෂිතතා අංශය | කමිටු සාමාජික |
| සුරනි අමරසිංහ මිය | අධ්‍යක්ෂ- මානව සම්පත් අංශය,<br>අන්සේල් ලංකා ආයතනය | කමිටු සාමාජික |
| නිමල් ගමගේ මයා | සහය අධ්‍යක්ෂක,<br>ෆොන්ටේරා සමාගම | කමිටු සාමාජික |
| දීපා වෙලයායුතම් මයා | සහකාර අධ්‍යක්ෂ,<br>දකුණු ආසියානු කලාපීය<br>Tarde සංගමය | කමිටු සාමාජික |
| එච්.එම්.කේ.බී.දයාරත්න මයා | සභාපති,<br>ජාතික සේවක සංගමය | කමිටු සාමාජික |
| වෛද්‍ය තිමති වික්‍රමසේකර මයා | විශේෂඥ වෛද්‍ය ,<br>කළුබෝවිල ශික්ෂණ රෝහල | කමිටු සාමාජික |
| වෛද්‍ය සායි නිරන්ජන් මයා | වෛද්‍ය පරීක්ෂක | කමිටු සාමාජික |
| ගයාන් ප්‍රනාන්දු මයා | ප්‍රධාන වෘත්තීය සුරක්ෂිතතා කළමනාකරු,<br>Halyes Adventist | කමිටු සාමාජික |

# පටුන


| | | |
|---|---|---|
| ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමියගෙ පණිවුඩය | | V |
| අධ්‍යක්ෂ මණ්ඩලය | | VI |
| පළමු පරිච්ඡේදය | | |
| 1.1 | හැඳින්වීම | 2 |
| 1.2 | දැක්ම, මෙහෙවර හා අරමුණ | 3 - 4 |
| 1.3 | සුවිශේෂි ප්‍රමුඛතා | 5 |
| 1.4 | ආයතනයෙහි කාර්යමණ්ඩලයේ සංයුතිය | 5 |
| දෙවන පර්ච්ඡේදය (ආයතනයේ ප්‍රධාන කාර්යයන්) | | |
| 2.1 | ආයතනයේ ප්‍රධාන කාර්යයන් | |
| 2.2 | සේවා සැපයීම | 8 - 13 |
| 2.3 | සේවාවන් | 8 - 13 |
| | 2.3.1 පාරිසරික මිනුම් සමීක්ෂණය | 9 |
| | 2.3.2 අවදානම් ඇගයීම | 9 |
| | 2.3.3 වෛද්‍යය පරීක්ෂණ | 9 |
| | 2.3.4 විශේෂ වැඩසටහන් | 9 |
| | 2.3.5 වෘත්තීය සුරක්ෂිතතා පාඨමාලාවන් පැවැත්වීම හැඳින්වීම | 9 |
| 2.4 | පාඨමාලා සැලැස්ම | 8 - 13 |
| | 2.4.1 පළමු මට්ටම | 10 |
| | 2.4.2 දෙවන මට්ටම | 9 |
| | 2.4.3 තෙවන මට්ටම | 9 |
| 2.5 | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම | 8 - 13 |

2.6 ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය සම්මාන

උළෙල පැවැත්විම 12

2.7 ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය

සම්මන්ත්‍රණය පැවැත්විම 12

2.2 ජාත්‍යන්තර සහයෝගීතාවය 14

2.2 සේවා පහසුකම් දියුණු කිරිම 14

2.2 තත්ත්ව සහතික ලබා ගැනීම 14

තෙවන පරිච්ඡේදය

3.1 සේවා සැපයීමේ ප්‍රගතිය 14

3.2 අවධානම් තක්සේරු 14

3.3 වෛද්‍ය පරික්ෂණ සිදු කිරිම 14

3.4 විශේෂ වැඩසටහන්වල ප්‍රගතිය 14

3.5 ජාතික වෘත්තීය සුරක්ෂිතතා සතිය 14

3.6 ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය සම්මාන

උළෙල පැවැත්විම 12

3.7 ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය

සම්මන්ත්‍රණය පැවැත්විම 12

3.8 ලෝක දෘෂ්ඨි දිනයට සමගාමීව සම්මන්ත්‍රණය 14

3.9 බියගම අක්ෂි සායනය 14

සිව්වන පරිච්ඡේදය

4.1 2023 වර්ෂයේදී ලබා ගත් සුවිශේෂී ජයග්‍රහණ හා 14

මුහුණ දුන් ගැටලු 12

පස්වන පරිච්ඡේදය

5.1 ආයතනයේ මූල්‍ය ප්‍රගතිය 14

# පළමු පරිච්ඡේදය

## ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනය

# ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනය

## 1.1 හැඳින්වීම

ශ්‍රී ලංකාව තුළ යහපත් වෘත්තීය ආරක්ෂණ ක්‍රියාමාර්ග හා යහපත් සෞඛ්‍යය පුරුදු අනුගමනය කරමින් සුරක්ෂිත හා සෞඛ්‍යය සම්පන්න ශ්‍රමබලකායක් බිහි කරලීමේ අරමුණින් 2009 අංක 38 දරණ ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍යය පිළිබඳ ආයතන පනත මඟින් කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ අනුබද්ධ ආයතනයක් ලෙසින් ජාතික වෘත්තිය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනය ස්ථාපිත කරන ලදී.

සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස පවතින අප රටෙහි දළ දේශිය නිෂ්පාදනය ඉහළ නංවාලීමට සෘජුවම බලපෑම් එල්ල කරනු ලබන වැඩ කරන ජනතාවගේ සේවයේ සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය සම්පන්න බව ආරක්ෂා කර දෙමින් සංවර්ධනය කරා වේගයෙන් පියනැගිමට අවශ්‍ය වන ශ්‍රම බලකායන් අප රටට දායාද කිරීම අපගේ ඒකායන පරමාර්ථයයි. නිරෝගීමත් ශ්‍රම බලකායක් බිහි කරලීම උදෙසා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය විසින් වැඩ පරිසරයේහි දි ඇති විය හැකි වෘත්තීය අනතුරු හා අවධානම් හඳුනාගෙන එම අනතුරු වළක්වා ගැනිම උදෙසා වෘත්තීය ආරක්ෂාව හා සුරක්ෂිතභාවය පිළිබඳව පුහුණුව මෙන්ම දැනුවත් කිරීම් නිරන්තරව සිදු කරනු ලබයි. එමෙන්ම වැඩ පරිසරයෙහි සේවය කරනු ලබන සේවකයන්ගේ සෞඛ්‍ය ආරක්ෂිතව පවතින්නේ ද යන්න හා වෘත්තීය ප්‍රමිතීන්ට යටත්ව සිදුවන්නේ ද යන්න තහවුරු කිරීම සඳහා පාරිසරික මිනුම් පරීක්ෂණ මගින් සහතික කිරීම සිදු කරනු ලබයි.

මෙම ආයතනය වසර 12ක් වැනි ඉතාම කෙටි කාලයකින් 2023 වර්ෂයේ සිට රජයට බරක් නොවී ස්වයං මූල්‍ය ආයතනයක් ලෙස ක්‍රියාත්මක වීම තුළින් වර්තමානයේ රට මුහුණ පා තිබෙන කෙටිකාලීන මූල්‍ය අර්බුධය විසදීම සඳහා පිටුවහලක් වී ඇති බව දන්වා සිටිමි.

## 1.2 දැක්ම මෙහෙවර හා අරමුණු

**දැක්ම**

"සැමට වෘත්තීය සුරක්ෂිතතාව සෞඛ්‍යය හා සුබ සාධනය ලබාදීම "

**මෙහෙවර**

"සේවා ස්ථානවල සුරක්ෂිතතාවය හා සෞඛ්‍යය සහතික කරලීම සහ ඵලදායීතාව වර්ධනය කිරීම සදහා සියලු ආකාරයේ රැකියා උපද්‍රවයන් වළක්වාලීම පිණිස අධ්‍යාපනය පුහුණුව හා පර්යේෂණය තුළින් ත්‍රෛපාර්ශවීය කොටස්කරුවන් සවිබලගැන්වීම "

### ආයතනයේ අරමුණු

(අ) සේවායෝජකයන්ගේ සහ සේවාදායකයන්ගේ ආරක්ෂාව සහ රැකියාවේ ආරක්ෂාව සහ රැකියාවේ ස්වභාවය සැලකිල්ලට ගනිමින් ඒ සේවායෝජකයන් සහ සෙ-ාවාදායකයන් යන දෙපාර්ශවයේම සේවා පරිසරය සම්බන්ධයෙන් වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ජාතික ප්‍රතිපත්තික් සකස් කිරීමේදි රජයට උපදෙස් දීමග

(ආ) සේවා ස්ථානවල දී රැකියාවට අදාළව සිදුවන හදිසි අනතුරු වැළැක්වීම සඳහා ගතයුතු පියවර සම්බන්ධයෙන් රජයට උපදෙස් දීමග

(ඇ) වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විමර්ශන අධ්‍යාපන වැඩසටහ-න් සමීක්ෂණ සහ පර්යේෂණ පැවැත්වීම කරගෙන යාම සහ ඒවාට සහාය දීමග

(ඈ) උපකරණ ල අන්තරායදායක ද්‍රව්‍ය ල භෞතික ල රසායනික හෝ ජීව විද්‍යාත්මක කාරක හෝ නිෂ්පාදන හෝ වෙනත් යම් අන්තරායකාරී ද්‍රව්‍ය නිවැරදිව භාවිතා කිරීම පිළිබඳ යම් ආයතනයකට හෝ තැනැත්තකුට උපදේශන සේවා සැපයීමග

(ඉ) වෙනත් යම් ආයතනයක් හෝ ලංකාවේ හෝ පිටරටක විශ්ව විද්‍යාලයක් සමඟ සහයෝගීතාවයෙන් හෝ ආයතනය විසින් වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ සහ ආශ්‍රිත විෂයයන් පිළිබඳ දැනුම සහ පුහුණුව අවශ්‍යය කරන සේවා නියුක්තිකයන්ට , පදිංචිකරුවන්ට , සේවකයන්ට හෝ වෙනත් යම් තැනැත්තකුට අධ්‍යාපන සහ අවශ්‍ය පුහුණුව ලබාදීම සහ ඒ අධ්‍යාපනය හෝ පුහුණුව නිම කිරීමෙන් පසු සහතික පත්‍ර හෝ ඩිප්ලෝමා ප්‍රදානය කිරීම.

(ඊ) උපකරණ , අන්ත්‍රාදායක ද්‍රව්‍ය , භෞතික , රසායනික , ජීව විද්‍යාත්මක කාරක හෝ නිෂ්පාදන නිවැරදිව භාවිත කිරීම පිළිබඳ සහ මනෝ සමාජ අන්ත්‍රායන් සහ හඳුනාගත් අන්ත්‍රායන් වැළැක්වීම පිළිබඳ අවශ්‍ය කරන සේවාවන් සැපයීම.

(උ)(*) වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍යට අදාළ වන කාරණාවලදී ප්‍රමිතිසංකේත, පරිචය සහ නියමු උපදේශන සම්බන්ධයෙන් නීතිමය අවශ්‍යතා පිළිබඳ අමාත්‍යවරයාට උපදෙස් දීම.

(*) වැඩ කටයුතු නිවැරදිව ක්‍රියාත්මක වන්නේ ද යන්න අධීක්ෂණය හා නිසියාකාරව සිදු වන්නේ ද යන්න ඇගයීමට ලක්කිරීම.

(ඌ) වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍යට අදාළ තොරුතුරු එක්රැස් කිරීම, සකස්කිරීම, බෙදාහැරීම සහ ප්‍රකාශයට පත්කිරීම සඳහා සහයෝගයෙන් කටයුතු කිරීම.

(එ) වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍යට සම්බන්ධව සම්මන්ත්‍රණ, වැඩමුළු හා වෙනත් වැඩසටහන් සම්පාදනය කිරීම සහ අනුග්‍රහය දැක්වීම.

(ඒ)වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය පිළිබඳ අන්තර් අමාත්‍යාංශ ව්‍යාපෘති, වැඩසටහන් සහ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම.

(ඔ)වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය පිළිබඳ පුහුණු ප්‍රවර්ධනය කිරීම සහ වැඩ දියුණු කිරීම සඳහා පුස්තකාල සහ විද්‍යාගාර පිහිටුවා පවත්වාගෙන යාම.

(ඕ) පර්යේෂණ සහ විශේෂ රසායනාගාර සංවර්ධනය කිරීම.

(ඍ) වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය ක්ෂේත්‍රය ට අදාළ ජාතික හා ජාත්‍යන්තර ආයතන විශ්වවිද්‍යාල හා අනෙකුත් සංවිධාන සමඟ සබඳතා පවත්වාගෙන යාම.

(*) වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය යන ක්ෂේත්‍රවල ජාතික ප්‍රමිතීන් ස්ථාපනය කිරීම.

## 1.3 සුවිශේෂී ප්‍රමුඛතා

1 වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පනත අනුව කටයුතු කරමින් කාලීන අවශ්‍යයතාවයන්ට අනුව සේවා සුරක්ෂිතතාවය හා සෞඛ්‍යය ගොඩනංවාලීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

2 වැඩකරන ජනතාව වෙත සුරක්ෂිත වෘත්තීය පරිසරයක් තුළ සෞඛ්‍ය සම්පන්නව සේවයේ නිරතවීමට අවශ්‍ය දැනුවත් කිරීම් හා පුහුණු පාඨමාලා තුළින් නිෂ්පාදන ඵලදායිතාවයද ඉහළ නැංවීමට කටයුතු කර තිබීම.

3 වෘත්තීය සුරක්ෂිතතා නිලධාරීන්ගේ දැනුම වර්ධනය කරමින් නව තාක්ෂණික උපකරණ පිළිබඳව අවබෝධය ලබා දෙමින් ප්‍රමිතියෙන් ඉහළ සෞඛ්‍ය හා ආරක්ෂණ ක්‍රම සේවා ස්ථානවල පවත්වාගෙනයාමට අවශ්‍ය පසුබිමක් සකස් කිරීම.

## 1.4 ආයතනයේ කාර්ය මණ්ඩලයේ සංයුතිය

| ජ්‍යෙෂ්ඨ මට්ටම | | තෘතීය මට්ටම | | ද්විතීය මට්ටම | | ප්‍රාථමික මට්ටම | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | ප්‍රතිශතය |
| 07 | 02 | 03 | 03 | 10 | 06 | 05 | 05 | 25 | 16 | 36% |

# දෙවන පරිච්ඡේදය

## ආයතනයේ ප්‍රධාන කාර්යයන්

## 2.1 ආයතනයේ ප්‍රධාන කාර්යයන්

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ ප්‍රධාන කාර්යය වනුයේ වෘත්තීය ආරක්ෂාව හා සුරක්ෂිතතාවය පිළිබඳව දැනුවත් කිරීම තුලින් වැඩකරන සේවක සේවිකාවන්ගේ වෘත්තීය ආරක්ෂාව හා සුරක්ෂිතතාවය ස්ථාපිත කිරීම මඟින් නිරෝගිමත් ශ්‍රම බලකායක් බිහිකිරීම වේ.

### 2.2 සේවා සැපයීම

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ සේවාවන් ලෙස පහත සේවාවන් දැක්විය හැකියි.

### 2.3 සේවාවන්

2.3. පාරිසරික මිනුම් සමීක්ෂණ
2.3.2 අවදානම් ඇගයීම
2.3.3 වෛද්‍ය පරීක්ෂණ හා යෝග්‍යතා සහතික නිකුත් කිරීම්
2.3.4 වෘත්තීය සුරක්ෂිතතා පාඨමාලා පැවැත්වීම
2.3.5 වෘත්තීය සුරක්ෂිතතා ඇගයීම් සම්මාන උළෙල සහ සම්මන්ත්‍රණය පැවැත්වීම්

### 2.3.1 පාරිසරික මිනුම් සමීක්ෂණ (Environmental monitoring)

සේවා ස්ථානවල වැඩ පරිසරය සේවයේ නිරතවීමට අවශ්‍ය මට්ටමක පවතින්නේද යන්න පාරිසරික මිනුම් සමීක්ෂණ මඟින් විමසුමට ලක්කරනු ලැබේ වාතයේ තත්ත්වය සමීක්ෂණය කිරීම **(Air Quality)** දුම් පරීක්ෂා කිරීම කර්මාන්තය තුළ දූවිලි මට්ටම සමීක්ෂණය කිරීම **(Dust)** ශබ්ද මට්ටම මැනීම **(Sound Level)** සහ උෂ්ණත්ව මට්ටම සමීක්ෂණය කිරීම මෙහිදී සිදුකරනු ලැබේ කර්මාන්තශාලාවේ වැඩ පරිසරය යෝග්‍ය මට්ටමක පවතින්නේද යන්න තහවුරු කිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුකූලව තාක්ෂණික මට්ටමින් ඉතා උසස් උපකරණ යොදා ගනිමින් පරීක්ෂාවට ලක්කර ඒ සඳහා නියාමන හා නිර්දේශ සේවා යෝජකයන් වෙත ලබා දෙන අතර එමගින් වෘත්තීය සුරක්ෂිතතාවය හා ආරක්ෂාව සේවයේ නිරතවීමට අවශ්‍ය පරිසරය ගොඩනැගෙනු ඇති මෙම පරීක්ෂණයෙන් දිවයින පුරා විසිරී පවතින කර්මාන්තශාලා මඟින් ආයතනයේ සේවාවන් ලබාගනු ලබයි.

### 2.3.2 අවදානම් ඇගයීම (Risk Assessment)

සේවයේ නිරත සේවකයන්ට මුහුණදීමට සිදුවන වෘත්තිමය අවදානම් සහගත තත්ත්වයන් පිළිබඳව විමසීමට ලක් කිරීමට අවදානම් ඇගයීම් මඟින් සිදු කරනු ලබයි. මෙහිදී ජාතික වෘත්තීය සුරක්ෂිතතා ආයතනයේ නිළධාරීන් එම වැඩ පරිසරය වෙත ගොස් එහි පවතින අවදානම් සහගත තත්ත්වයන් පරීක්ෂාවට ලක්කරනු ලබයි. එසේ පරීක්ෂාවට ලක්කර එහි පවතින අවදානම් සහගත තත්ත්වයන් පිළිබඳව කළමනාකාරිත්වය දැනුවත් කිරීම හා ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව උපදෙස් සේව්‍ය පාර්ශවයට ලබාදීම සිදුකරනු ලබයි.මෙම අවධානම් ඇගයීම තුලින් ආයතනයන

වෙත පහත ප්‍රතිලාභ අත්කර ගැනීමට හැකි වේ වඩාත් ඵලදායී ලෙස අරමුදල් වෙන් කිරීමට සේවා යෝජකයන්ට හැකි වීම, ඵලදායී ලෙස සේවකයින්ගේ ආරක්ෂාව ඇති කිරීම තුලින් අනතුරු ඇති වීමේ සම්භාවිතාව අවම කිරීමට හැකි වීම, ආයතනයේ භෞතික මෙන්ම මානව සම්පත්වල ආරක්ෂාව තහවුරු කිරීමේ හැකියාව ලැබීම.

## 2.3.3 වෛද්‍ය පරීක්ෂණ (Medical Testing)

කාර්යාල හා කර්මාන්තශාලාවන්හි සේවයේ නිරත පුද්ගලයින් සඳහා වෛද්‍ය පරීක්ෂණ තුලින් වෘත්තීයට අදාල රෝගාබාධ පිළිබඳ අවධානම හදුනාගැනීම හා යම් වෙනත් රෝගාබාධ වලින් පෙලෙන සේවක සේවිකාවන්ගේ සේවා පරිසරය වෙනස් කිරීම මෙන්ම අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර නියම කිරීමෙන් මනා සෞඛ්‍යමත් නිරෝගි ශ්‍රම බලකායක් බිහිකිරීම මෙම පරීක්ෂණය මඟින් සිදුකරනු ලබයි.

අප ආයතනය විසින් සිදුකරනු ලබන වෛද්‍ය පරීක්ෂණ ලෙස ශ්‍රවණ තත්ත්වය මැන බැලීම, රුධිර පරීක්ෂණ පෙනහළුවල ක්‍රියාකාරීත්වය මැන බැලීම දෘෂ්ඨි පරීක්ෂණය හා වැඩ කිරීමට යෝග්‍යතාවය තහවුරු කිරීම යන පරීක්ෂණයන් සිදු කරනු ලබයි. මේ සඳහා ප්‍රවීණ වෛද්‍යවරුන් හා අපගේ තාක්ෂණික නිලධාරීන් සහභාගී වන අතර ශ්‍රමිකයන් සේවයේ නිරතවීමට යෝග්‍ය වන්නේද යන්න හා ඔවුන්තුල පවතින රෝගාබාධ මොනවාද යන්න පිලිබඳව අදාල ආයතනය දැනුවත් කරනු ලැබේ. මෙම සේවාවන් අදාල ආයතනවෙත ගොස් සිදු කරනු ලබයි.

## 2.3.4 විශේෂ වැඩසටහන්

දෛනික සේවාවන් සැපයීමට අමතරව විශේෂ වැඩසටහන් පවත්වාගෙන යාම අප ආයතනයේ සපයන ප්‍රධාන සේවාවකි. එහිදී පුහුණු වැඩසටහන්, වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය සම්බන්ධ ව්‍යාපෘති, වෘත්තීය ආරක්ෂාව හා සුරක්ෂිතතා සම්මාන උළෙල හා සම්මන්ත්‍රණය පැවැත්වීම හා ක්ෂේත්‍රට අදාළ පර්යේෂණයන්හි නියළීම විසින් සිදු කරනු ලැබේ.

## 2.3.5 වෘත්තීය සුරක්ෂිතතා පාඨමාලාවන් පැවැත්වීම හැඳින්වීම

පසුගිය වසර 15ක කාලය තුල වෘත්තීය සුරක්ෂිතතා ඩිප්ලෝමා හා සහතිකපත් පාඨමාලා සම්පූර්ණකල ශිෂ්‍ය ශිෂ්‍යාවන් 5000කට අධික පිරිසක් ශ්‍රී ලංකාවේ කර්මාන්ත ශාලාවන්හි හා වැඩබිම්හි සේවයේ නිරතව සිටි. ඔවුන් විසින් තම සහෝදර සේවක සේවිකාවන්ගේ වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය ආරක්ෂා කරනු ලබන හෙයින් සිදුවීමට ඇති ආපදා හා අනතුරු අවම කරගැනීමට මනා පිටුවහලක් වීමත් අනතුරු වාර්තා කිරීමේ ප්‍රවනතාවක් රටතුල ඇතිව තිබේ මේ තුලින් නව වෘත්තීය සුරක්ෂිතතා සංකල්පයක් බිහිකිරීම ඉවහල් වී ඇත.

එහිදී අවශ්‍ය වෘත්තීය සුරක්ෂිතතාව පිළිබඳව අධ්‍යයනය කිරීමට අපේක්ෂා කරන පුද්ගලයන් ලබා ඇති අධ්‍යාපන මට්ටම් අනුව සහ සේවා පළපුරුද්ද මත මෙම පාඨමාලාවන් හා පුහුණුවීම් සඳහා සහභාගිවීමට අවස්ථාව හිමි කර දෙනු ලැබේ ජාතික වෘත්තීය සුරක්ෂිතතා උසස් ඩිප්ලෝමා පාඨමාලාව (**NVQ 06**), ජාතික වෘත්තීය සුරක්ෂිතතා ඩිප්ලෝමා පාඨමාලාව (**NVQ 05**), ජාතික වෘත්තීය සුරක්ෂිතතා

සහතික පත්‍ර පාඨමාලාව (**NVQ 04**), හා කෙටිකාලින පුහුණුවීම් වැඩසටහන් අප විසින් පවත්වනු ලැබේ. එහි පාඨමාලා සැලැස්ම පහත ආකාරයට දැක්විය හැකියි.

## 2.4 පාඨමාලා සැලැස්ම




### 2.4.1 පළමු මට්ටම

අප විසින් සිදුකරනු ලබන කෙටිකාලීන පුහුණු වැඩමුළු පළමු මට්ටමට ඇතුළත්වන විශේෂ පුහුණුවීම් ලෙස දැක්විය හැකිය.

- ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා වන වැඩමුළු
- අපද්‍රව්‍යය කළමනාකරණ පුහුණුවීම් වැඩමුළු
- වෘත්තීය සුරක්ෂිතතාවය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළු
- හෙදියන් සඳහා වන වැඩමුළු
- සෞඛ්‍යය සේවකයින් සඳහා වෘත්තීය ආරක්ෂාව පිළිබඳ වැඩමුළු
- කාර්යාල සේවකයින් සඳහා වෘත්තීය ආරක්ෂාව පිළිබඳ වැඩමුළු
- රසායනාගාර සේවකයින් සඳහා රසායනාගාර ආරක්ෂාව පිළිබඳ වැඩමුළු
- ආහාර කළමනාකරණය සඳහා වෘත්තීය ආරක්ෂාව පිළිබඳ වැඩමුළුව
- කාර්මික සේවකයින් සඳහා ආරක්ෂිත රසායනික කටයුතු පිළිබඳ වැඩමුළුව
- සේවකයින් සඳහා යහපත් මානසික සෞඛ්‍යයක් පවත්වාගෙ යාම පිළිබඳ වැඩමුළු

මෙම පුහුණුවීම් දිනක්, දෙකක් හෝ තුනක් සාමාන්‍යය වශයෙන් පවත්වනු ලැබේ. සමහර අවස්ථාවලදී කාර්මාන්තයන්හි ඉල්ලීම පරිදි මෙම පුහුණු වැඩසටහන් ක්‍රියාවට නංවනු ලැබේ. මෙම පුහුණුවීමේ වැඩසටහන් පළමු මට්ටමේ පුහුණුවීම් වන අතර අදාළ පුහුණුවීම් අවසානයේදී ඔවුන් ලැබූ පුහුණුව පිළිබඳව සහතික පත්‍රයක්ද ඔවුන් වෙත ලබාදීමට අප කටයුතු කරනු ලැබේ.

### 2.4.2 දෙවන මට්ටම

දෙවන මට්ටමට අයත් පුහුණුවීම් වැඩසටහන් ලෙස ප්‍රධාන වශයෙන් ජාතික වෘත්තීය සුරක්ෂිතතාව පිළිබඳ වු සහතික පත්‍ර පාඨමාලාවයි **(Certificate Course)** මෙම පාඨමාලාව සඳහා අවම සුදුසුකම වශයෙන් අපොස උසස් පෙළ සමත්ව තිබිය යුතුයි සේවයේ නිරත සේවක සේවිකාවන්ට පැමිණිය හැකි පරිදි සති අන්තයේදී පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. එලෙසම යම් ආයතනයකට ඉල්ලීම මත අප විසින් සති තුනක් පුරා නොනවත්වාම මෙම සහතික පත්‍ර පාඨමාලාව සිදු කරන අවස්ථාද ඇත.

### 2.4.3 තෙවන මට්ටම

ජාතික වෘත්තීය සුරක්ෂිතතා ආයතනය තෙවන මට්ටම ලෙස ජාතික වෘත්තීය සුරක්ෂිතතා ඩිප්ලෝමා පාඨමාලාව ඉංග්‍රිසි හා සිංහල මාධ්‍යයෙන් පවත්වාගෙන යනු ලබන අතර ඒ සඳහා හඬු **LEVEL** 5 නිපුනතා සහතිකය ලබාදෙනු ලබයි. කර්මාන්තයන්හි පවතින අවශ්‍යතා හා එම අවශ්‍යතා තක්සේරු කිරීමෙන් අනතුරුව ඩිප්ලෝමා පාඨමාලාව සකස්කර ඇති මෙය මොඩියුල දෙකක් යටතේ පවතින අතර එක් මොඩියුලයන් සඳහා අවශ්‍ය දැනුම මාස 6ක් පුරාවට ලබාදෙන අතර එක් මොඩියුලයක් අවසානයේදී ඒ සඳහා මොඩියුල විභාගය පවත්වනු ලැබේ.

## 2.5 වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම

රාජ්‍ය නොවන සංවිධාන සමඟ එක්ව වෘත්තීය සුරක්ෂිතතාවය ඉහල නැංවීම උදෙසා දෙස් විදෙස් ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන අතර 2023 වර්ෂයේදී දකුණු ආසියාතික රටවල්හී වතු ක්ෂේත්‍රයේ සේවයේ නියැලී සිටින සේවක සේවිකාවන්ගේ වෘත්තීය සුරක්ෂිතතාවය සොයා බැලීම සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානය සමඟ එක්ව තෝරාගත් තේ, පොල් හා රබර් යන ක්ෂේත්‍රයන් සමීක්ෂණය සඳහා යොදාගත් අතර එම වාර්තාව ජාත්‍යන්තර කම්කරු සංවිධානය වෙත ලබාදෙන ලදී.

## 2.6 ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සම්මාන උළෙල සංවිධානය කිරීම

සේවා ස්ථානයන්හි සේවක සේවිකාවන්ගේ වෘත්තීය සුරක්ෂිතතාවය හා ආරක්ෂාව වෙනුවෙන් කැපවී කටයුතු කරන සේවා යෝජකයින් ඇගයීමට ලක්කිරීම මෙම සම්මාන උලෙලේ මූලික අරමුණ වේ. සේවාදායකයින්ගේ සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය පිළිබඳ නිරන්තරයෙන් විමසුමට ලක් කරමින් ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ඇගයීම මෙන්ම අනෙකුත් කර්මාන්තයන්ටද ඒවායේ ආදර්ශය ලබාදීම මෙමගින් සිදුකෙරේ මෙම සම්මාන උළෙල වසර දෙකකට වරක් පවත්වනු ලබයි. මෙවැනි සම්මාන උළෙලකදී සම්මානයන් සඳහා තේරීපත්වීමට ආයතන කළමනාකාරීත්-වය නිතැතින්ම ඉදිරිපත්වන අතර අතර ඒ තුලින් දිවයින පුරා සුරක්ෂිත වැඩබිම් සංකල්පය ස්ථාපිත කිරීමට හැකියාවක් උදා වේ.

## 2.7 ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සම්මාන උළෙල සංවිධානය කිරීම

සෑම වසරකම ඔක්තෝම්බර් දෙවන සතිය වෘත්තීය සුරක්ෂිතතා සතිය ලෙස නම් කර ඇති අතර එම සතිය සැමරීම උදෙසා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය විවිධ වැඩසටහන් සැලසුම් කරනු ලබයි. එහි ප්‍රධානම දැනුවත් කිරීමක් ලෙස සේව්‍ය සේවක දෙපාර්ශවයේම සහභාගීත්වයෙන් පවත්වනු ලබයි. එමෙන්ම මෙම වැඩමුළුව මඟින් සුරක්ෂිතතා නිලධාරීන් හට නව තාක්ෂණික දැනුම ලබා දීම හා නව තාක්ෂණික උපකරණ ආදිය පිළිබඳව දැනුවත් කිරීම සිදු කරයි. මෙම සම්මන්ත්‍රණය සඳහා විදේශීය දේශකයින්ගේ දායකත්වටද ලබා ගනිමින් ඔවුන් සතු නව දැනුම අප රටට ලබා ගැනීමට අප කටයුතු කරන්නෙමු. තවද මෙහිදී න්‍යායාත්මක දැනුම හා ප්‍රායෝගික පුහුණුව සුරක්ෂිතතා නිලධාරීන් වෙත දෙනු ලබයි.

## 2.8 ජාත්‍යන්තර සහයෝගීතාව

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය විසින් ජාත්‍යන්තර ආයතන වරින් වර එළිදක්වන වෘත්තීය සුරක්ෂිතතා ප්‍රමිති සම්බන්ධයෙන් නිරන්තර අවධානයෙන් සිටින අතර එම ප්‍රමිති අතුරින් දේශීය කර්මාන්තශාලා සඳහා අවශ්‍ය ප්‍රමිති එළි දක්වනු ලබයි. එමෙන්ම ජාත්‍යන්තරව පවතින ජාතික වෘත්තීය සුරක්ෂිතතා ආයතන**(NIOSH)** හා විශ්ව විද්‍යාල එක්ව කටයුතු කිරීම තුලින් ශ්‍රී ලාංකිය වෘත්තීය සුරක්ෂිතතාවය ඉහල මට්ටමකට ගෙන ඒමට මෙය ඉවහල් වී ඇත.

## 2.9 සේවා පහසුකම් දියුණු කිරීම්

අප ආයතනයේ ප්‍රමිතිය ඉහළ මට්ටමට නංවා ගැනීම උදෙසා මෙන්ම භෞතික පහසුකම් දියුණු මට්ටමකට ගෙන ඒමට අප නිරන්තයෙන්ම උත්සහ දරන්නෙමු. එහිදී ආයතනයේ ප්‍රමිතිය පවත්වා ගැනීමට ආයතනයේ සේවා පරිසරයද වැඩ කිරීමට යෝග්‍ය පරිදි ගොඩනංවාලීමට අවැසි කටයුතු සම්පාදනය කිරීමට අප වගබලා ගන්නෙමු.

## 2.10 ආයතනයේ ප්‍රමිතිය ඉහළනංවා ගැනීමට අවශ්‍ය තත්ත්ව සහතික ලබා ගැනීම

අපගේ පුහුණු වැඩසටහන් ඉතාම ඉහළ මට්ටමේ ප්‍රමිතියන් යටතේ අප විසින් සිදු කරනු ලැබේ. ඒ සඳහා අවශ්‍ය ජාත්‍යන්තර පිළිගත් ප්‍රමිති සහතික ලබාගැනිමට කටයුතු කර ඇත.

# තෙවන පරිච්ඡේදය

## ආයතනයේ ප්‍රගතිය

# ආයතනයේ ප්‍රගතිය

## 3.1 සේවා සැපයීමේ ප්‍රගතිය

අප ආයතනය විසින් දෛනික කාර්යයන් ලෙස සිදු කරනු ලබන පාරිසරික මිනුම් සමීක්ෂණ 182 ක් සිදු කිරීමට 2023 වර්ෂයේදී අවස්ථාව උදාවිය. පහත 3.1 වගුව ඇසුරෙන් අප සිදු කරනු ලැබූ සේවාවන් පිළිබඳව අවබෝධයක් ලබා ගත හැකිය.

| පාරිසරික සමීක්ෂණ | ආයතන ප්‍රමාණය |
|---|---|
| ආලෝකය පිළිබඳ සමීක්ෂණ | 1550 |
| ශබ්ධය පිළිබඳ සමීක්ෂණ | 1100 |
| උෂ්ණත්වය පිළිබඳ සමීක්ෂණ | 960 |
| දූවිල්ල පිළිබඳ සමීක්ෂණ | 1220 |
| වාතය පිළිබඳ සමීක්ෂණ | 225 |
| වාත සමීක්ෂණය පිළිබඳ සමීක්ෂණ | 232 |

3.1 වගුව පාරිසරික මිනුම් සමීක්ෂණය

## 3.2 අවදානම් තක්සේරු කිරීම

වැඩබිමෙහි පවතින සේවකයින් හට අනතුරු හා රෝගාබාධයන්ට ලක්වීමේ අවධානම් හඳුනාගෙන ඊට අදාල ආයතනය විසින් කලයුතු ක්‍රියාමාර්ග පිලිබඳව වාර්තාවක් හා නිර්දේශ ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය විසින් දෙනු ලැබේ.

## 3.3 වෛද්‍ය පරීක්ෂණ සිදු කිරීම්

රටක පවතින නිෂ්පාදනය ඉහල නංවාලීම උදෙසා අනිවාර්යයෙන්ම නිරෝගීමත් සෞඛ්‍ය සම්පන්න ශ්‍රම බලකායක් සිටිය යුතු අතර එම කාර්යය සඳහා දායකත්වය සැපයීම උදෙසා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය ආයතනයන්හි ඉල්ලීම් වලට අනුව එම වැඩබිමවෙත ගොස් එහි සේවක සේවිකාවන්ගේ නිරෝගීතා-වය අධීක්ෂණය කරනු ලබන අතර ඊට අදාල වෛද්‍ය නිර්දේශ ලබාදෙනු ලබයි. ජාතික වෘත්තීය සුරක්ෂිතතා ආයතනය විසින් පහත සඳහන් වෛද්‍ය පරීක්ෂණයන් සිදුකර ඇත.

NIOSH හි පහත පරීක්ෂණ පහසුකම් ඇත.

- ශ්‍රවන පරීක්ෂාව
- විවිධ රසායනික නිරාවරණ සඳහා රුධිර පරීක්ෂාව
- රැකියා සඳහා යෝග්‍යයතාවය සහතික කිරීම
- පෙනහළු ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීම
- දෘශ්‍යය පරීක්ෂා කිරීම

අනතුරුදායක නිරාවරණයන් හේතුවෙන් සේවකයින්ගේ බලපෑම තක්සේරු කිරීම සඳහා සිදු කරන ලදී.
ඒ අනුව පහත පරීක්ෂණ

| අධ්‍යයනය කළ ආයතන ගණන | සිදු කරන ලද පරීක්ෂණ වර්ගය | සිදු කරන ලද පරීක්ෂණ ගණන |
|---|---|---|
| 20 | පෙනහළු ක්‍රියාකාරිත්වය | 750 |
| | ශ්‍රවන පරීක්ෂාව | 115 |
| | සිදු කරන ලද පරීක්ෂණ වර්ගය | 45 |
| එකතුව | | 910 |

3.1.2 විශේෂ වැඩසටහන්වල ප්‍රගතිය

## 3.4 සේවා සැපයීමේ ප්‍රගතිය

සෞඛ්‍ය හා සුරක්ෂිත නිළධාරීන් පුහුණු කිරීම අප ආයතනය විසින් සිදු කරනු ලබන සුවිශේෂී වැඩසටහනකි. 2023 වර්ෂයේදී සිදු කරන ලද විශේෂ වැඩසටහන්වල ප්‍රගතිය පහත වගුව පරිදි වේ. ඒ තුලින් මෙරටතුල සුරක්ෂිතතා වැඩපරිසරයක් නිර්මාණය වීමට නිතැතින්ම සිදුවනු ලබයි.

| වැඩසටහන | කාලපරිච්ඡේදය |
|---|---|
| ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව (ඉංග්‍රීසි මාධ්‍ය) | 2023 ජනවාරි (කණ්ඩායම් අංක 01) |
| ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (ඉංග්‍රීසි මාධ්‍ය) | 2023 මාර්තු 19 (කණ්ඩායම් අංක 25) |
| ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (සිංහල මාධ්‍ය) | 2023 ඔක්තොම්බර් 13 (කණ්ඩායම් අංක 26 |

| වැඩසටහන | කාලපරිච්ඡේදය |
| --- | --- |
| ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 2023 පෙබරවාරි 12 (කණ්ඩායම්අංක 47)<br>2023 පෙබරවාරි 16 (කණ්ඩායම් අංක 48)<br>2023 ජුනි 2 (කණ්ඩායම් අංක 49)<br>2023 ජූලි 23 (කණ්ඩායම් අංක 50)<br>2023 ඔක්තොම්බර් 20 (කණ්ඩායම් අංක 51) |
| ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ පදනම් පාඨමාලාව | 2023 අප්‍රේල් 27 (කණ්ඩායම් අංක 08) |
| විධායක ශ්‍රේණි නිළධාරීන් සඳහා වන විශේෂ පාඨමාලාව | 2023 මාර්තු 16 (කණ්ඩායම් අංක 08)<br>2023 සැප්තැම්බර් 30 (කණ්ඩායම් අංක 09) |
| විධායක ශ්‍රේණි නිළධාරීන් සඳහා වන පාරිසරික කළමණාකරනය පිළිබඳ පාඨමාලාව | 2023 ජූලි 13 (කණ්ඩායම් අංක 03) |
| අඩු ආදායම්ලාභී පවුල්වල සාමාජිකයන් සඳහා ජාත්‍යන්තර කම්කරු ආයතනය හා Safe Foundation ආයතනයේ මූල්‍ය අනුග්‍රහය යටතේ එක්ව පැවැත්වූ වෘත්තීය සාත්තුසේවිකාවන් පුහුණු කිරීමේ පාඨමාලාව | 2023 මාර්තු 01 , 02<br>2023 අප්‍රේල් 28 , 09 |
| සුරාබෝ් පුද්ගලික ආයතනය සමඟ එක්ව පවත්වනු ලැබූ සාත්තු සේවික සේවිකාවන් පුහුණු කිරීමේ වැඩසටහන | 2023 පෙබරවාරි 12<br>2023 මාර්තු 30<br>2023 අප්‍රේල් 22<br>2023 ජූනි 23 |

ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව නිම කළ සිසුන්ගේ වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳව දැනුම වැඩිදියුණු කිරීම සඳහා සහ අදාල ක්ෂේත්‍රය තුල විශේෂඥදැනුම ලබා දීම සඳහා මෙම උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව හඳුන්වාදෙන ලදී. මෙම පාඨමාලාව මේ වනවිට පවත්වාගෙන යනු ලැබේ. 2024 වර්ෂයේ මාර්තු මස වන විට පාඨමාලාව අවසන් කිරීමට නියමිතය.

2023 වර්ෂය තුළදී ඩිප්ලෝමා පාඨමාලාතුනක් පවත්වන ලදී. අපගේ ඩිප්ලෝමා පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් හා සිංහල මාධ්‍යයෙන් සමන්විත වේ. 2023 වර්ෂයේදී ඉංග්‍රීසි මාධයයෙන් පාඨමාලා දෙකක් හා සිංහල මාධ්‍යයෙන් එක් පාඨමාලාවක් පවත්වන ලදී.ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වන ලද කණ්ඩායම් දෙකට සිසුන් 74 දෙනෙකුගෙන් සමන්විත වන අතර සිංහල මාධ්‍ය පාඨමාලාව සිසුන් 16 දෙනෙක්ගෙන් සමන්විත වේ.

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳව සහතිකපත්‍ර පාඨමාලා පහක් 2023 වර්ෂයේදී පවත්වන්නට කටයුතු කරන ලදී. කණ්ඩායම් 47, 48, 49, 50 හා 51 2023 වර්ෂයේදී ආරම්භ කරන ලදී. මෙම පාඨමාලාවන් පහෙන් තුනක් 2023 වර්ෂයේදී අවසන් කර ඇති අතර කණ්ඩායම් 50 හා 51 2024 වර්ෂයේ ජනවාරි මාසයේදී අවසන් කිරීමට නියමිතයි සිසුන් 86ක් 2023 වර්ෂයේදී පාඨමාලාව අවසන් කරනු ලැබූ අතර තවත් සිසුන් 53ක් 2024 වර්ෂයේ ජනවාරි මාසයේදී පාඨමාලාව අවසන් කිරීමට නියමිතය.

අප ආයතනය විසින් සිදු කරනු ලබන ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳව පදනම් පාඨමාලාවක් 2023 වර්ෂයේදී පවත්වන ලදී 8 වන කණ්ඩායම සිසුන් 14 දෙනෙක්ගෙන් සමන්විත විය. පාඨමාලාව නිම කරන ලද සිසුන් පුහුණුවීම් සඳහා යොමුකර ඇති 2023 වර්ෂයේදී විධායකශ්‍රේණි නිළධාරීන් සඳහා වන විශේෂ පාඨමාලා දෙකක් පවත්වන්නට කටයුතු කරන ලදී.සිසුන් 19 දෙනෙකුගෙන් සමන්විත 08 වන කණ්ඩායම සාර්ථකව පාඨමාලාව නිම කරනු ලැබූ අතර සිසුන් 22 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් පාඨමාලාව හදාරමින් සිටී.

## 3.5 ජාතික වෘත්තීය සුරක්ෂිතතා සතිය

සෑම වර්ෂයකම ඔක්තොම්බර් මස 2 වන සතිය රැකියාවල නියුක්ත වෘත්තිකයන්ගේ සෞඛ්‍යය හා සුරක්ෂිතතාවය තහවුරු කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය සතිය ප්‍රකාශයට පත්කොට ඇත.

### අරමුණු

මෙවර ජාතික වෘත්තීය සුරක්ෂිතතා සතිය 2023 නොවැම්බර් මස තෙවන සතියේදී පැවැත්විණි

1 ජාතික වෘත්තීය සුරක්ෂිතතා ජාතික සම්මන්ත්‍රණය
2 ජාතික වෘත්තීය සුරක්ෂිතතා ජාතිකසම්මාන උළෙල

## 3.6 වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පිළිබඳ ජාතික සම්මන්ත්‍රණය

12 වන වරටත් අති උත්කර්ෂවත් අන්දමින් සේව්‍ය සේවක හා රජයේ සහභාගීත්වයෙන් 500කට නොවැඩි වෘත්තිකයන්ගේ සහභාගීත්වයෙන් කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය ගරු මනූෂ නානායක්කාර හා කම්කරු හා විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍ය ගරු ජගත් පුෂ්පකුමාර මැතිතුමන්ලාගේ ප්‍රධානත්වයෙන් 2023 නොවැම්බර් මස 22 වන දින ෂැංග්‍රිලා හෝටලයේදී පැවැත්විනි.

මෙම වර්ෂයේ සම්මන්ත්‍රණයේ තේමාව වූයේ ත්‍රෛයිපාර්ශවීය කමිටු පිහිටුවීම ''මඟින් වෘත්තීය සංස්කෘතියක් බිහි කිරීම'' යන්නයි මේ සඳහා දෙස් විදෙස්හි ප්‍රවීණ වෘත්තීය සුරක්ෂිතතා ක්ෂේත්‍රයේ ප්‍රවීණයනගේ හරවත් දේශනාවලින්ද සමන්විත විය. මෙම සම්මන්ත්‍රණය සඳහා ප්‍රධාන මූල්‍ය අනුග්‍රහය **INDUSTRIYAL SAFETY & KARAM** ආයතනවිසින් ලබාදෙන ලදී. ඉතිරි සියළු වියදම් ටිකට්පත් අලෙවියෙන් සපයාගනු ලැබීය.


Bipartite committees are the
KEY
To drive safety culture

## 3.6.1 ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සම්මාන උළෙල

වැඩකරන ශ්‍රී ලාංකික ජනතාවට වැඩබිමේදී සිදුවන අනතුරු හා රෝගාබාධ වලක්වාලීම හා එම අනතුරු වලින් සිදුවන හානිවීම් අවම කිරීම සඳහා වැඩබිම් පරිසර සම්බන්ධයෙන් කැපවී ක්‍රියාකල ආයතන ඇගයීමේ අරමුණින් **NIOSH** ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය විශිෂ්ඨතා සම්මානය 2022 සිව්වන වරටත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය ගරු මනුෂ නානායක්කාර මැතිතුමා හා රාජ්‍ය අමාත්‍ය ජගත් පුෂ්පකුමාර මැතිතුමන්ලාගේ ප්‍රධානත්වයෙන් 2023 නොවැම්බර් මස 22 වන දින කොළඹ ශැන්ග්‍රිලා හෝටලයේදී පැවැත් වූ අතර මේ සඳහා දිවයින පුරා පිහිටි විවිධ ක්ෂේත්‍රයන් නියෝජනය කරන සේව්‍ය සේවක දෙපාර්ශවයන් විශාල පිරිසක් සහභාගී විය.

මෙම සම්මාන උළෙල සඳහා ආයතන 200ක් පමණ අයදුම්පත් යොමුකර තිබුණි. ශ්‍රී ලංකාවේ විශිෂ්ඨතම වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පුහුණුව ලබාදෙන කර්මාන්තශාලා ඇගයීම මෙහි මූලික පරමාර්ථයයි. ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය මඟින් පවත්වනු ලබන සිව්වන සම්මාන උළෙල මෙය වූ අතර අපක්ෂපාති ලෙස විශේෂඥ කණ්ඩායමක් මඟින් මෙම සම්මානලාභීන් අදියර 3ක් යටතේ තෝරාගන්නා ලදී.

පළමු අදියර ලෙස තේරීම් කමිටුව විසින් ආයතන විසින් සම්පූර්ණ කර එවනු ලැබූ අයදුම්පත් නිර්නායකයන්ට අදාලව තිබේදැයි පරීක්ෂාකර බලන ලදී. දෙවන අදියර ලෙස පළමු පියවරෙන් තෝරාගනු ලැබූ ආයතන වෙත විශේෂඥ කණ්ඩායම් යොදවා නිරීක්ෂණය කර ලකුණු ලබා දී සුදුසු ආයතන තෝරාපත්කර එසේ තෝරාගනු ලැබූ කර්මාන්තශාලා විශිෂ්ඨ විශේෂඥ මණ්ඩලයක් වෙත ඉදිරිපත්කර සම්මානලාභීන් තෝරාගනු ලැබීය. 2022 වර්ෂයේදී ඇගයීමට ලක්වූ ආයතන පහත පරිදි වේ.

### ප්‍රධාන විශිෂ්ඨතා සම්මාන - බහුවිධ

| | |
|---|---|
| රන් සම්මානය | යුනිලීවර් ආයතනය(ආගරපතන) |
| රිදී සම්මානය | යුනිලීවර් ශ්‍රී ලංකා ආයතනයහොරණ |
| ලෝකඩ සම්මානය | ෆින්ලේ සමාගම කොළඹ |

### දේශීය විශිෂ්ඨතා සම්මාන

| | |
|---|---|
| රන් සම්මානය | **MAS - Active Kreeda Vanavil** |
| රිදී සම්මානය | **Lion Brewery (Ceylon & PLC)** |
| ලෝකඩ සම්මානය | **Brandix Apperal Solutions ltd - Mirigama** |

### නිෂ්පාදිත ආයතන සඳහා සම්මාන

| | |
|---|---|
| **Brandix Apperal Solutions ltd -** | **Mirigama** |
| **Litro Gas Lanka** | **Small & Medium** |

## ආහාරපාන අංශය සඳහා සම්මාන

| | |
|---|---|
| Cocacola Beverages Srilanka | Large |
| Condiments Ltd | Small & Medium |

## සංචාරක අංශය සඳහා සම්මාන

| | |
|---|---|
| Cinnamon Citadel | Small & Medium |

## ඉදිකිරීම් අංශය සඳහා සම්මාන

| | |
|---|---|
| Hyundai Engineering Construction | Large |
| Access Eng-Central Equipment Division | Small & Medium |

## ඇඟළුම් අංශය සඳහා සම්මාන

MAS Active (Pvt) Ltd - MAS KREEDA

## ප්‍රවාහන හා සැපයුම් අංශය සඳහා සම්මාන

| | |
|---|---|
| SAGT (Pvt)LTD | Large |
| GAC Shipping Limited | Small & Medium |

## අනෙකුත් අංශ සඳහා සම්මාන

Lakvijaya Power Plant - Norochcholai
Litro Gas Terminal Lanka(Pvt&Ltd) - Wattala


GOLD AWARD
SILVER AWARD
APPAREL AND TEXTILES
National












## 3.7 ලෝක දෘෂ්ටි දිනයට සමගාමීව සම්මන්ත්‍රණය

2023 ඔක්තෝබර් 9 වන දින ලෝක දෘෂ්ටි දිනය නිමිත්තෙන් වෘත්තීයේ යෙදී සිටියදී සිදුවිය හැකි දෘෂ්ඨි අනතුරු හා රෝගලක්ෂණ පිළිබඳ සේවක සේවිකාවන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනයේ **(NIOSH)** ශ්‍රවණාගාරයේ සම්මන්ත්‍රණයක් පවත්වන ලදී. මෙම වැඩමුළුව සඳහා කර්මාන්තශාලා සේවක සේවිකාවන් 100 දෙනෙකු සහභාගී විය. විෂන් 2020 වැඩසටහනේ ජාතික සම්බන්ධීකාරක **(Vision 2030 Insight)** වෛද්‍ය කපිල බන්දුතිලක ශ්‍රී ලංකාවේ අක්ෂි වෛද්‍ය විද්‍යාලයේ සභාපති වෛද්‍ය තවුෆීක, වෛද්‍ය සමිත සිරිතුංග, උපදේශන ප්‍රජා වෛද්‍යවරිය, සෞඛ්‍යඅමාත්‍යංශය, අක්ෂි තාක්ෂණ විද්‍යා පීඨයේ කාර්ය මණ්ඩලය, ජාතික අක්ෂි රෝහලේකාර්ය මණ්ඩලය හා **Vision Care** කාර්ය මණ්ඩලයේ සහභාගිවන්නන් වැඩමුළුව සාර්ථකව නිම කරන ලදී.







# World Sight Day 2023











# සිව්වන පරිච්ඡේදය

## 2023 වර්ෂයේදී ලබා ගත් සුවිශේෂී ජයග්‍රාහණ හා ආයතනය මුහුණ දුන් ගැටලු

# 4.1 2023 වර්ෂයේදී ලබා ගත් සුවිශේෂී ජයග්‍රාහණ හා ආයතනය මුහුණ දුන් ගැටලු

2023 වර්ෂය තෙක් අප ආයතනයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ භාණ්ඩාගාරයෙන් මූල්‍ය ප්‍රතිපාදන ලබාදුන් අතර මෙම වර්ෂයේ සිට එසේ රජ්‍ය භාණ්ඩාගාරයට වැය බරක් නොවී ස්වයං මූල්‍ය ආයතනයක් ලෙස ක්‍රියාත්මක වන අතර උපයනු ලබන ආදායමෙන් යම් ප්‍රතිශතයක් රාජ්‍ය භණ්ඩාගාරය වෙත මුදා හැරීමට අප බලාපොරොත්තු වන්නෙමු. වසර 12ක් වැනි ඉතා කෙටිකාලයක් තුලදී නිවැරදි ව්‍යාපාර සැලැස්මක් හා කළමනාකාරීත්වයක් තුලින් සේවක මණ්ඩලයේ විශාල කැපවීම මෙම ලැබූ ප්‍රගතියේ යථාර්ථය වේ මෙය 2023 වර්ෂයේ අප ලැබූ සුවිශේෂිතම ජයග්‍රහනයකී.

එමෙන්ම ශ්‍රී ලාංකීක සිසුන් සඳහා දකුණු කොරියාවේ **Changsin** විශ්ව විද්‍යාලයේ **Machanical Engineering** උපාධිය හැදෑරීමට අවශ්‍ය කටයුතු සකස්කර දිමේ ජාතික කර්තවයට එම විශ්ව විද්‍යාලය හා ගිවිසුම් ගත විමට අපට හැකියාව ලැබි ඇති එහි මුලික පියවර වශයෙන් සිසුන් 13 දෙනෙක් තෝරා ගෙන ඔවුන්ට අප ආයතනයේ ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට අවස්ථාව ලබා වැඩිදුර අධ්‍යනය සඳහා දී ඔවුන්ට උපාධි පාඨමාලාවට යොමු කිරීමට අවශ්‍ය සැලසුම් 2023 වර්ෂයේදී සකස් කෙරුනි. ඒ තුළින් ශ්‍රී ලාංකීක සිසුන්හට **E - 7** වීසා කාණ්ඩය යටතේ වෘත්තීයේ නියැලීමට හැකියාව ලබාගැනිමට අවස්ථාව උදාවන අතර **NIOSH** කළමනාකාරීත්වය හා විශ්ව විද්‍යාල කළමනාකාරීත්වය සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකීය සිසුන් සඳහා 50% වට්ටමක් සහිතව උපාධි පාඨමාලාව නිම කිරීමට ද එකඟ වි ඇති එහිදී ශ්‍රී ලාංකීක සිසුන් සඳහා දකුණු කොරියාවේ රැකියා අවස්ථා ලබාගැනිමට පහසුවෙන් අවස්ථාව උදා කර ගැනිමට හැකියී මෙය 2023 වර්ෂයේදී අප ලබාගත් සුවිශේෂී ජයග්‍රහනයකී.






# පස්වන පරිච්ඡේදය

## ආයතනයේ මූල්‍යය ප්‍රගතිය

## 4.1 ආයතනයේ මූල්‍ය ප්‍රගතිය

| | 2022 | 2023 |
|---|---|---|
| වෘත්තීය සුරක්ෂිතතා පාඨමාලා වලින් ලද ආදායම | 16,907,600 | 20,411,014 |
| පාරිසරික මිනුම් වලින් ලද ආදායම | 12,923,195 | 15,630,975 |
| වෙනත් ආයතන සමඟ ඇතිකරගත් සහයෝගිතා ගිවිසුම් තුලින් සපයනු ලැබූ සේවා සඳහා ලබාගත් අදායම | 18,385,561 | 18,467,444 |
| වෛද්‍ය පරීක්ෂණ කටයුතු තුලින් ලද ආදායම | 960,265 | 1,406,970 |
| වෘත්තීය සෞඛ්‍ය සුරක්ෂිතතා සතිය තුලින් ලද ආදායම | 4,945,500 | 13,833,665 |
| පොලී ආදායම | 29,242,289 | 43,981,585 |
| වෙනත් ආදායම් | 146,950 | 170,000 |
| **එකතුව** | **83,511,360** | **113,901,713** |

## 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය

| වත්කම් | 2023 | 2022 |
|---|---|---|
| **ජංගම වත්කම්** | | |
| මුදල් හා මුදල් සමාන වත්කම් | 9,076,033.00 | 6,421,557.00 |
| ලැබිය යුතු අයිතම | 31,192,902.00 | 31,265,546.00 |
| සංවර්ධන අරමුදල වෙනුවෙන් කරනු ලැබූ අයෝජන | 268,964,862.00 | 202,543,847.00 |
| | 309,233,797.00 | 240,230,950.00 |
| **ජංගම නොවන වත්කම්** | | |
| දේපල පිරියත හා උපකරණ | 50,691,587.00 | 58,913,977.00 |
| | | |
| **මුළු වත්කම්** | 359,925,383.00 | 299,144,927.00 |
| | | |
| **වගකීම්** | | |
| **ජංගම වගකීම්** | | |
| ගෙවිය යුතු බිල්පත් | 8,722,039.00 | 4,384,599.00 |
| | | |
| මුළු වගකීම් | 8,722,039.00 | 4,384,599.00 |
| **ශුද්ධ වත්කම්** | **351,203,244.00** | **294,760,327.00** |
| | | |
| **සමුච්චිත අතිරික්තය** | 351,203,244.00 | 294,760,327.00 |
| **මුළු ශුද්ධ වත්කම්** | **351,203,344.00** | **294,760,327.00** |
| | | |

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරන ප්‍රමිතීන්ට (SLPSAS) අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන අත්සන් කර ඉදිරිපත් කරන ලදී.

සභාපති    අධ්‍යක්ෂ ජනරාල්    අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික    ගණකාධිකාරී

## මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශය - 2023 දෙසැම්බර් 31 දිනට

| **ආදායම්** | **2023** | **2022** |
|---|---|---|
| භාණ්ඩාගාර ප්‍රධාන | | 6,268,890.00 |
| මෙහෙයුම් ආදායම් | 56,086,463.00 | 49,323,571.00 |
| පොලී ආදායම | 43,981,585.00 | 29,242,289.00 |
| ජා.වෘ.සු.සම්මාන හා සම්මන්ත්‍රණයේ ආදායම | 13,833,665.00 | 4,945,500.00 |
| | **113,901,713.00** | **89,780,250.00** |
| **වියදම්** | | |
| පරිපාලන වියදම් | 45,272,939.00 | 29,948,337.00 |
| ජා.වෘ.සු.සම්මාන හා සම්මන්ත්‍රණයේ වියදම් | 14,365,231.00 | 4,646,774.00 |
| ක්ෂය වීම් | 7,059,714.00 | 7,068,521.00 |
| | | |
| **මුළු වියදම්** | **66,697,884.00** | **41,663,332.00** |
| වසර සඳහා අතිරික්ත මුදල | 47,203,829.00 | 48,116,618.00 |

211

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } LSW/B/NIOSH/SR/01/2023 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2024 ජූලි 24 දින

සභාපති
ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතනය

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්.එම්.යූ.එස්.ඒ.විජේකෝන්
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත : 1. ලේකම්, කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය.
2. ලේකම්, මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මගේ අංකය / எனது இல. / My No. } LSW/B/NIOSH/SR/1/2023 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2024 ජූලි 24 දින

සභාපති
ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතනය.

**ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 ප්‍රකාරව 2022 වර්ෂයේදී සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් වී තිබූ රු.1,468,598 ක් වටිනා පිරියත හා උපකරණ අයිතම හා රු.1,376,969 ක් වටිනා ලිබඩු උපකරණ ප්‍රත්‍යාගණනය කිරීම සිදුකර නොතිබුණි.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

(ආ) පෙර වර්ෂයේ ලැබිය යුතු පොලී ආදායම් ගිණුම තුල සිදු වූ වැරදි සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කිරීමේදී වැරදි ලෙස ගැලපීම් කිරීමෙන් ආයෝජන ගිණුම සහ ආරම්භක සංචිත ගිණුම යන ගිණුම් දෙකම රු.10,355,671 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) වර්ෂයේ බදු පෙර ලාභය ගණනය කිරීමේදී සැලකිල්ලට ගෙන තිබුණු 2023 වර්ෂයට අදාළ පාරිතෝෂික වියදම වන රු.467,090 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී සැලකිල්ලට ගෙන නොතිබුණි.

(ඈ) ස්ථාවර තැන්පතු කල් පිරීමෙන් පසු ලද ස්ථාවර තැන්පතු පොලී නැවත ආයෝජනය ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශන තුල රු.55,421,025 ක මුදලක් පෙන්වා තිබුණද එම ශේෂය තුල පෙර වර්ෂයේ වැරදි නිවැරදි කිරීම් වැරදියට ගිණුම්ගත වීම් වලට අදාල රු.10,355,671 ක මුදලක් ද, වැරදි ගණනය කිරීම් තුලින් ජනනය වූ රු.66,455 ක මුදලක් ද, වර්ෂය තුල ලංකා බැංකුවේ ආයෝජනය කල රු.10,000,000 ස්ථාවර තැන්පතු මුදල ද ඇතුලත්ව පැවතුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුලදී ආයතනයේ නිළධාරීන් 2 කුට රු.372,043 ක් ආපදා ණය ලබාදී තිබූ අතර මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුල සේවක ණය ගෙවීම් ලෙස රු.672,480 ක් දක්වා තිබුණි.

(ඊ) ආයතනයේ සේවකයන් 4 දෙනෙකු හට සිදුකර තිබූ වැඩිපුර වැටුප් ගෙවීම් මුදලින් වර්ෂය තුලදී රු.156,995 ක් අයකර ගෙන තිබූ අතර එම මුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට ඇතුලත් කොට නොතිබුණු අතර, එම වැඩිපුර ගෙවූ වැටුපෙන් ඉතිරි මුදල වන රු.835,716 මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල කාරක ප්‍රාග්ධන සංචලන යටතේ පෙන්වීමට කටයුතු සිදුකර නොතිබුණි.

(උ) ජංගම වගකීම්වල වර්ෂයේ කාරක ප්‍රාග්ධන සංචලනය ලෙස රු.4,337,440 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට එකතු කොට ඇතත් ඒ තුල පාරිතෝෂික වල වෙනස්වීම් ඇතුලත්ව පැවතුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 ආයතනයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් ආයතනයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට ආයතනයේ කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

ආයතනයේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

**1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනාපාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| **නීතිරීති / විධානයට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත 83 ඒ පරිච්ඡේදය 2022 අංක 45 දරණ දේශීය ආදායම් (සංශෝධන) පනත හා අංක PED 01/ 2023 චක්‍රලේඛය. | අත්තිකාරම් පුද්ගල ආදායම් බදු ගණනයේ දී තනතුරට හිමි වැටුප් සහ දීමනා හැර එම තනතුරෙහි රාජකාරි ඉටු කිරීමේදී ලබාගත් සියලු දීමනා ද ඇතුළත්ව අත්තිකාරම් පුද්ගල ආදායම් බදු ගණනය කළ යුතු වුවද දේශන ගාස්තු, සම්පත් දායක ගාස්තු හා වාර්ෂික ප්‍රසාද දීමනා යනාදිය සැලකීමෙන් තොරව අත්තිකාරම් පුද්ගල ආදායම් බදු ගණනය සිදුකර තිබුණි. |

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 ( උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

| **බලතල, කර්තව්‍ය හා කාර්යය** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) 2009 අංක 38 දරන ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතන පනත | |
| (i) 20 (1) උපවගන්තිය | අමාත්‍යවරයා විසින් පනතේ විධිවිධාන යටතේ ආයතනයේ කර්තව්‍ය කිසිවක් හෝ ඒ සියල්ල කරගෙනයාමේ කාර්යය සඳහා සහ පනතේ මූලධර්මවලට බලාත්මකභාවයක් ලබාදීමේ කාර්යය සඳහා නියෝග සාදනු ලැබිය හැකි වුවත් එම නියෝග |

සාදා නොතිබුණි.

(ii) 11 වන වගන්තිය

ආයතනයේ කාර්යක්ෂම පරිපාලනය සඳහා අවශ්‍ය වියයුතු පරිදි ආයතනයේ අධ්‍යක්ෂවරු වශයෙන් යම් තැනැත්තන් සංඛ්‍යාවක් සභාව විසින් පත්කරනු ලැබිය යුතු වුවත් එසේ නම් කර නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

2.3 **වෙනත් කරුණු**

ආයතනයෙහි අනුමත කාර්යය මණ්ඩලය, 25 ක් වූ අතර 2023 දෙසැම්බර් 31 දිනට තත්‍ය කාර්යය මණ්ඩලය 15 ක් විය. කාර්යමණ්ඩලයේ ජ්‍යෝෂ්ඨ මට්ටමේ අනුමත තනතුරු 7න් 5ක්ම පුරප්පාඩුව පැවැති අතර ආයතනයේ කාර්ය හා කර්තව්‍ය මෙහෙයවීමේදී අණ පනත් මගින් පැවරෙන කාර්යයන් අධ්‍යක්ෂ මණ්ඩලය පවරාදෙන කළමනාකරණ කාර්යයන් ඉටු කිරීමෙහි නිරත වන ප්‍රධාන විධායක නිලධාරී තනතුර වන අධ්‍යක්ෂ ජෙනරාල් තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් නිලධාරියකුගේ සේවය ලබාගෙන තිබුණි.

W.P.C.වික්‍රමරත්න
විගණකාධිපති

6

Ministry of
Labour and
Foreign Employment

NIOSH
National Institute of
Occupational Safety and
Health • Sri Lanka

National Institute of Occupational
Safety & Health

No. 97 , Jawatta Road, Colombo 05, Sri Lanka

+ 94 112 585 425 / + 94 112 585 425 / info@niosh.gov.lk